අභ්‍යන්තරයෙන් කෙරුණු දැඩි පෙළඹවීම නිසාම බව පිළිගත යුතුව ඇත. අපි අම්බලමක, එනම් නවාතැන්පොලක සිට සුළු උදේ ආහාර වේලක් ගතිමු. ඉන්පසුව ශ්‍රීපාදයේ තඹ ආකෘතියක් තිබෙන විහාරය නැරඹීමු. එය කඳු මුදුනේ ඇති රන්මුවා සිරිපා සළකුණේ ආකෘතියක් බව දැන ගන්නට ලැබුණි.

කන්දට යන ගමනේ පැල්මඩුල්ල දක්වා වාහන වලින් ගමන් කල හැකි නමුදු එතැනින් එහාට නම් එළුවෙකුගේ පිටේ හැරෙන්නට පාද හතරකින් යුත් වෙනත් කිසිම දෙයකට යා නොහැක. මෙතැන් සිට මුදුනට අඩි 6,250කි. නමුත් වන්දනාකරුවන්ගේ පා ගමන් මග සැතපුම් දහයකට වඩා ඇත. ගමනේ මුල් කොටස තියුණු ප්‍රපාත සහිත ගල් කුළු වටා වැටී ඇත. පගලට වැටෙන ගල් කැබලි වල හඬ එම දර්ශන පථයෙන් ඉවත් වී බොහෝ වේලාවක් ගත වන තෙක් ඇසේ. ඉන් එහාට වැල් වලින් කරදරයක් හෝ පසුපස එලවා එන පරපුටුවන් හෝ දක්නට නොලැබුණත් මග දිගට මියන පැලෑටි, පෙඳ සහ රොඩොඩෙන්ඩ්‍රන් මල් තිබුණි. පැල්මඩුල්ල පසු කල පසු වාතය ඉතා ප්‍රබෝධමත් විය. කුඹුරු යායවල් කිහිපයක් පසු කිරීමෙන් අනතුරුව සියක් අතට විහිද යන කළු ගංගාවට ජලය සපයන අතු ගංගාවක් වෙත පැමිණියෙමු. අඩි තිහක් දිග රළු ලෑලි පාලමක් ඒ හරහා දමා තිබුණි. පාලමේ බිමට අල්ලා තිබුණේ අඟලක පමණ ඝනකමින් යුත් මෝපස් නම් වූ කුරු විශේෂයකි.

පැය භාගයක දුෂ්කර නැගීමකින් පසු අපි පිටතට නෙරා ඇති මුදුනක් සහිත කඳු ගැටයක පාමුලට පැමිණියෙමු. එතැන මොහොතක් ගිමන් හැර නැවත ගමන් අරඹා උඩ පවනැල්ල, එනම් කන්දේ ඉහලින්ම ඇති ජනාවාසය තෙක් නැග ඇල් මැරුණු කෝපි උගුරක් බීවෙමු. ඉන්පසු අපේ උපරිම උත්සාහය යොදා ගස් වල මුල් සහ රළු ගල් බොරළු සහිත දිය හිඳුණු ඇලක් ඔස්සේ ඉදිරියට ඇදුනෙමු. අඩි 2700 ක් උස ස්ථානය දක්වා මෙම පණ ගැහෙන ගමනේ යෙදුනෙමු. එතැනදී අපේ කුලී කරුවන් අපව නවතා පෙන්වූයේ පහත බැලූ විට හිස කරකැවිල්ල ඇති වන ආකාරයේ අඩි හත් සියයක හෝ අට සියයක තියුණු ප්‍රපාතයකින් යුතු නිලි හෙල නම් වූ ස්ථානයකි. තරුණියක් එතැනින් පැන සිය ප්‍රේමය වෙනුවෙන් දිවි පුදා ඇත. එතැන ඉතා පැහැදිලි දෝංකාරය ඇති තැනකි. මිය ගිය තරුණියගේ නම හඬ නගා කියූ විට එම අවාසනාවන්ත දැරිවියගේ භූතාත්මය පිළිතුරු දෙන බවට ස්වදේශිකයින් අතර බිය මුසු විශ්වාසයක් පවතී. ගමනේ මේ පසු කරන ඉසව්වේ තැනින් තැන ගිමන් හැරීමට ලී බංකු තබා ඇත. තැනින් තැන තබා ඇති කිසියම් සළකුණකට එතැන පසු කර යන්නෝ ආශිර්වාද පතා ගලක් විසි කරති. ඌරු හොට නමින් හඳුන්වන තැනකට එල්ලය බලා ගලක් දමති. ඉක්බිතිව පාලමක් ලෙස තනි ඒදණ්ඩක් දැමූ දියපාරකින් එතෙරව, තවත් සැතපුම් කීපයක් ඝන කැලෑව මැද්දෙන් ගමන් කොට දිය බෙත්ම, නැතහොත් ජලය බෙදී යන ස්ථානය නම් වූ කුඩා තැන්නකට පැමිණියෙමු. අප මේ සිටින්නේ කළු ගඟ ආරම්භ වන ස්ථානයේය. මෙතැනින් දකුණු දෙසට ගලන බවක් පෙනෙන ගඟ බෙදී ගොස් උතුරට හෝ වයඹට ගලන ගඟවල් හා මිශ්‍ර වී ගොස් කුරු ගඟට එකතු වේ. දිය උල්පතේ ආරම්භය වළාකුළුවලින් ගැවසී ගත් කඳු මුදුනෙන් කොතැනක හෝ සැඟවී තිබේ. මෙතැන ඉතා දැකුම්කළු ස්ථානයකි. දිගින් දිගට දිග හැරී යන පතන බිම්, ළඳු කැලෑ, නොඉඳුල් වනාන්තර බැලූ බැලූ අත දිස් වේ. අතනින් මෙතනින් දකින්නට ලැබෙන්නේ දිළිසෙන සුදු කඳන් වලින් යුත් පුවක් ගස්ය. මහ පොලව දෙව් ලොව බවට පත් කරන දසුනක් මෙතැනට පෙනේ. පහත් බිමෙන් ගමන් ඇරඹූ පසු ප්‍රථම වතාවට සීනි පාන් ගෙඩියක් මෙන් පෙනෙන තේජාන්විත කන්දේ මුදුන් කොටස මට දැක ගන්නට ලැබුණි. සැතපුම් තුනක් ඈතින් පිහිටි එය හුදකලා තේජස්වී විලාශයෙන් නිල් අහසට එසවී සිටී. කුඩා ශ්‍රීපාද පන්සල ද යාන්තමට පෙනේ. මා සිටින තැන සිට පෙනෙන මේ දර්ශනය සමස්තයක් ලෙස ගත්කල මගේ මනසට නැගෙන්නේ ඇල්ප්ස් සිට ටියුරින් නගරයට බසින අතරතුර බටහිර දෙසින් ඉලිප්පී පෙනෙන මොන්ටේවිසෝ හි මන බඳින දර්ශනයයි.

**සිරිපා වන්දනාවේ තවත් කොටසක් ලබන කලාපයේ.**

පරිවර්තනය ශ්‍රියා කුමාරසිංහ


# ALG & ASSOCIATES

**FOR ALL YOUR TAXATION, ACCOUNTING & BOOKKEEPING NEEDS**

- Individual & Business Income Tax Returns (Partnership, Trust & Company)
- Self Managed Superannuation Funds
- Accounting & Bookkeeping
- Business Activity Statements (GST Returns) & Instalment Activity Statements
- Company Secretarial
- Business Consultants
- Tax Planning

**Arjuna Gunawardena CPA B.Ec**
Registered Tax agent

ABN 63 865 123 157
PO Box 1335 Glen Waverly 3150
Tel - (03) 9802 3322
Fax - (03) 9802 6654
Mobile - 0438 194 827
Email - aplus_ms@bigpond.net.au

# Have Peace of Mind....talk to us

**ඔබේ සිතට සැනසුම ලබාගන්න . . . අදම අප අමතන්න**



ඔබේ මූල්‍ය අවශ්‍යතාවයන්ට
අපෙන් නොමිලේ උපදෙස් හා සේවා රැසක්

A PLUS Aplus Mortgage Solutions

**We will help you to solve your financial needs.**

**We deal with reputed banks and other financial institutions.**
**We are confident of giving the fitting product to meet your needs.**

**We can help you with**
Home Loans
Business Loans
Construction Loans
Lines of Credit
Debt Consolidation
Investment Loans
Low Doc and No Doc Loans
Commercial Loans
Zero Deposit Loans

A PLUS
We can also help you with a FREE Mortgage Health Check to see whether your present arrangements are adequate

MIAA

Call our mortgage consultant
**Arjuna Gunawardena CPA B.Ec**
**on (03) 9802 3322 0438 194 827**
**or e mail us aplus_ms@bigpond.net.au**

Ace Financial Solutions Pty Ltd trading as Aplus Mortgage Solutions
ABN 49 111 011 182 P O Box 1335 Glen Waverley Victoria 3150
Telephone +61 3 9802 3322 Facsimile +61 3 9802 6654 Email aplus_ms@bigpond.net.au